සියලුම හිමිකම් ඇව්රිණිඅAll Rights Reserved

# Royal College - Colombo 07
## රාජකීය විද්‍යාලය - කොළඹ 07

11 | S | I

## Grade 10 – Second Term Test – October 2023
දෙවන වාර පරීක්ෂණය – 2023 – ඔක්තෝම්බර් - 10 ශ්‍රේණිය

කාලය : පැය 1
Time: 1 hour

## බුද්ධ ධර්මය – I

Name: - ............................................................ class: -................. Index no: - .......................

සැලකිය යුතුයි.
- සියලුම ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන උත්තරය තෝර ගන්න.

1. සිදුහත් කුමරු රාහුල කුමරු උපන් බව අසා ආපසු එන විට අසන්නට ලැබුනේ,
   1. ජයමංගල ගාථා  2. ජත්ත මානවක ගාථා
   2. නිබ්බුත ගාථා  4. සතර පෙර නිමිති

2. රම්‍ය, සුරම්‍ය , සුභ යන මාලිගා තුනෙහි හිමිකරු වූයේ,
   1. රාහුල කුමරු  2. සිදුහත් කුමරු
   2. නන්ද කුමරු  4. අහිංසක කුමරු

3. තුන්තරා බෝධිය යනු,
   1. බුද්ධ, ධම්ම, සංඝ  2. අනිත්‍ය , දුක්ඛ, අනාත්ම
   3. පාරමී, උපපාරමී, පරම පාරමී  4. බුදු, පසේ බුදු, මහරහත්

4. සමත භාවනාවේ කමටහන් ගණන වන්නේ,
   1. 40 කි.  2. 28 කි.  3. 72 කි.  4. 24 කි.

5. "බොහෝදෙනාගේ හිත සුව පිණිස චාරිකාවේ හැසිරෙන්න" මෙසේ දේශනා කළේ,
   1. භද්දවග්ගීය කුමාරවරුන්ට  2. පස්වග තවුසන්ට
   2. පළමු රහත් සැට නමට  3. සැරියුත් මුගලන් දෙනමට

6. පස්වග භික්ෂූන් වහසේලා රහත් වූයේ,
   1. දම්සක් පැවතුම් සූත්‍රය අසා  2. අනත්ත ලක්කණ සූතුය අසා
   3. මංගල සූත්‍රය අසා  4. අදිත්ත පරියාය සූත්‍රය අසා

7. බුදු සසුනේ ප්‍රථම ආරාම පූජාව වූ වේළුවනාරාමය කරවා පූජා කළේ,
   1. බිම්බිසාර රජතුමා  2. අනේපිඩු සිටුතුමා
   3. සුදොවුන් රජතුමා  4. අජාසත්ත රජතුමා

8. අවබෝධ කරගත් ධර්මය කෙලෙස්හරිත ජනයාට දේශනා කිරීමේ අපහසුතාවය පිළිබඳ සිතමින් සිටින විට දහම් දෙසීමට ආරාධනා කළේ,
   1. සගම්පති බ්‍රහ්මයා  2. සුදෝවුන් රජතුමා
   3. සංජය පිරිවැජියා  4. තපස්සු භල්ලුක

9. ගිහි විනය නමින් හැඳින්වෙන්නේ,

1. රතන සූත්‍රය 2. සිගාලෝවාද සූත්‍ර 3. අග්ගඤ්ඤ සූත්‍රය 4. පරාභව සූත්‍රය

10. "සිල්වත් සමාගම" නමින් සංවිධානයක් පිහිටුවා ගත්තේ,

1. රේරුකානේ චන්ද්‍රවිමල හිමි. 2. සරණංකර හිමි
2. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි 4. වැත්තැවේ හිමි

11. "පුබ්බචරිය" නමින් හැඳින්වෙන්නේ,

1. ගුරුවරුන් 2. ස්වාමීන් වහන්සේලා
3. දෙමාපියන් 4. බුදුරජාණන් වහන්සේ

12. සදිසා නමස්කාරයේදී දෙමාපියන්ගෙන් දරුවන්ට ඉටු විය යුතු යුතුකමක් නොවන්නේ,

1. වරදින් මුදවා ගැනීම 2. අවාහ විවාහ කරදීම
3. මැනවින් හික්මවීම 4. සම්පත් පවරා දීම.

13. සිදුහත් කුමරුට ගිහිගෙය හැර යාමට බල පෑ හේතු අතර ප්‍රධාන වන්නේ,

1. රාහුල කුමරුගේ ඉපදීම. 2. සතර පෙර නිමිති දැකීම.
3. නිබ්බුත පද ඇසීම 4. ඉහත සියල්ල.

14. සිදුහත් කුමරුගේ හා යසෝදරාවන්ගේ විවාහය සිදුවන විට සිදුහත් කුමරුගේ වයස වූයේ,

1. අවු. 29 කි. 2. අවු. 16 කි. 3. අවු. 18 කි. 4. අවු. 28 කි.

15. ආර්ය මාර්ගයේ ගමන් කළ හෙයින්ද සුන්දර නිවනට පැමිණි හෙයින්ද බුදුන්වහන්සේ,

1. සුගත නම් වන සේක 2. අරහං නම් වන සේක
3. ලෝකවිදූ නම් වන සේක 4. සම්මා සම්බුද්ධ නම්වන සේක

16. ගිහි බෞද්ධයාගේ නිත්‍ය සීලය වන්නේ,

1. දස සීලයයි. 2. අෂ්ටාංග සීලයයි.
3. පංච සීලයයි. 4. ආජීව අෂ්ටමක සීලයයි..

17. බුදු සසුනේ ප්‍රථම ද්වේවාචික උපාසකවරු වන්නේ,

1. පස්වග මහනුන්ය. 2. සැරියුත් මුගලන් දෙනම
3. තපස්සු බල්ලුක 4. බරණැස් සිටු හා බිරිඳ

18. බෞද්ධයාගේ අත්පොත හෙවත් ධම්ම පදයෙන් අයත් වග්ග ගණන

1. 12 කි. 2. 32 කි. 3. 18 කි. 4. 26 කි.

19. සිගෝලාවාද සූත්‍රයට අනුව භෝග විනාශයට හේතුවන කරුණු අතර අයත් නොවන කරුණ වන්නේ,

1. සුදුවෙහි යෙදීම. 2. පව්වු මිතුර ඇසුර.
3. අලසකම. 4. උපේක්ෂා සහගත වීම.

20. දුටුගැමුණු රජතුමා කළ අංගයක් නොවන්නේ,

1. ථූපාරාම වෙහෙර 2. රුවන්වැලි මහා සෑය
2. මිරිසවැටිය 4. ලෝවාමහාපාය



Scanned with CamScanner

21. ශීලය සම්පූර්ණ වීමට තිබිය යුතු ගුණාංගයකි.
1. සමාදානය 2. කුසල් 3. දානය 4. අර්ථ චර්යාව

22. සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස පහ අතරින් එකකි.
1. කීර්තිය පැතිරීම. 2. අවමන් නොලැබීම.
3. ධනවතෙකු වීම 4. ආයුෂ වැඩි වීම.

23. භෝග විනාශ මුඛ භයෙන් එකකි.
1. අල්ලස 2. මත්පැන් පානය 3. සොරකම 4. විෂම ලෝභය

24. සිඟාලෝවාද සූත්‍රයට අනුව දකුණු දිශාවෙන් සංකේතවත් කරන්නේ,
1. මව්පිය - දූදරු සබඳතාය 2. ගුරු - ශිෂ්‍ය සබඳතා
3. ස්වාමි - සේවක සබඳතාය 4. ගිහි - පැවිදි සබඳතා

25. ශිෂ්‍යයෙකු විසින් ගුරුවරයාට කළ යුතු යුතුකමකි.
1. මැනවින් ඉගෙන ගැනීම 2. මැනවින් ඉගැන්වීම
3. මැනවින් හික්මවීම 4. සුදුසු කල්හි සම්පත් පවරා දීම

26. පද්මාකාර ජීවිතය මේ නමින් හඳුන්වයි.
1. මධ්‍යම ප්‍රතිපදාව 2. ආර්ය ප්‍රතිපදාව
2. සල්ලේඛ ප්‍රතිපදාව 4. හිරි ඔතප්ප

27. බෞද්ධ ජීවිතයට බොහෝ සමීප එලකි.
1. පද්මය 2. රෝස 3. අරලිය 4. නෙළුම් මල

28. පද්මාකාර ජීවිතයකට අවශ්‍ය ගුණාංගයකි.
1. සතර අගතියෙන් තොරවීම 2. අටලෝ දහමින් කම්පා වීම
3. තණ්හාව අවම කිරීම 4. සතර පෙර නිමිති

29. අපේක්ෂා හා සහජීවනය මූර්තිමත් කරයි.
1. සිව්බඹ විවරණ 2. සතරපෙර නිමිති
3. සිව්පසය 4. අසරණයන්ට පිහිට වීම

30. බුදුන්වහන්සේ අන්‍ය මතවාද ඉවසීම හා ගරු කිරීම අවවාදයෙන් මෙන්ම ආදර්ශයෙන් පෙන්වූ අවස්ථාවකට උදාහරණයකි.
1. වෙනත් ආගමික උතුමන් හා සුහදව සාකච්ඡා කිරීම.
2. යමක් විමසා බලා කටයුතු කිරීම් අවස්ථාව තහවුරු කිරීම.
3. වාද - විවාද මගින් තම මතය තහවුරු කිරීම.
4. සියල්ල කර්මයෙන්ම පමණක් සිදුවිය යන මතය පිළිගැනීම.

31. විපාක දෙන කාලය අනුව කර්මය
1. සතර ආකාර වේ. 2. දෙයාකාර වේ
2. ත්‍රිවිධාකාර වේ. 4. සීමාවක් නොවේ.



Scanned with CamScanner

32. සත්වයාගේ උත්පත්තිය ගෙන දිමට සමත් කර්මය මේ නාමයෙන් හඳුන්වයි.

1. ආසන්න කර්මය
2. ගරුක කර්මය
3. කටත්තා කර්මය
4. ජනක කර්මය

33. දේශය, කාලය, පුද්ගලයා මත වෙනස් නොවන විශ්ව සාධාරණ ධර්මතාවයකි.

1. ත්‍රිලක්ෂණය
2. පංචශීලය
3. ආගම
4. භාෂාව

34. පංචස්කන්ධයේදී රූපයට උපමා කර ඇත.

3. දිය බුබුලක්
2. මිරිගුවක්
3. පෙණ පිඩක්
4. මායාවක්

35. පටිච්ච සමුප්පාද න්‍යායෙ තුළින් පැහැදිලි කරගත හැකි කරුණු දෙකින් එකකි.

1. සමාජගත දුක
2. අනාත්මවාදය
3. අටලෝ දහම
4. පිදිය යුත්තන් පිදීම

36. වඩාත් නිවැරදි ප්‍රකාශ තෝරන්න.

1. දිළිඳුකම් නිසා සොරකම් වැඩිවේ.
2. සොරකම නිසා ධනය වැඩිවේ .
3. ආගම නිසා බලය වැඩි වේ.
4. බලය නිසා කුහක කම වැඩි වේ.

37. විපරිනාම දුකට අයත් වේ.

1. සතුට
2. ඉපදීම
3. මරණය
4. ලෙඩවීම

38. කාම තණ්හාව යනු,

1. පස්කම් සැපතට ඇති ආශාවයි.
2. භෞතික සම්පත් වලට ඇති ආශාවයි.
3. මම හෙවත් ආත්මයට ඇති බැඳීමයි.
4. මෙලොව හැකිතාක් සැප විඳීමට ඇති කැමැත්තයි

39. ආර්ය අශ්ටාංගික මාර්ගයට අයත් වේ.

1. නුපන් අකුසල් ඇති කිරීමට උත්සාහ නොකිරිම
2. මරණින් මතු ඊළඟ ආත්මය සුවපත් වීම.
3. ගැටළු අවම කරනැනීම.
4. උපන් කුසල් සංරක්ෂණය කරගැනීම.

40. මහී ගංගා තීරයේදී දේශනා කළ සූත්‍ර දේශනාව මේ නමින් හඳුන්වයි.

1. සෝණ දණ්ඩ සූත්‍රය
2. මහා සීලනාද සූත්‍රය
3. ධනිය ගෝපාල සූත්‍රය
4. දම්සක් පැවතුම් සූත්‍රය

PAST PAPERS WIKI

Scanned with CamScanner

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/All Rights Reserved

**Royal College - Colombo 07**

රාජකීය විද්‍යාලය - කොළඹ 07

| 11 | S | II |
|---|---|---|

**Grade 10 – Second Term Test - October 2023**

කාලය : පැය 2 / Time: 2 hours

දෙවන වාර පරීක්ෂණය - 2023 - ඔක්තෝම්බර් - 10 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය - II

Name: - .................................................. class: -.................. Index no: - ..................

සැලකිය යුතුයි.
- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පිළිතුරු පැහැදිලි අත් අකුරින් ලියන්න.

1.
   i. බුදුන් වහන්සේගේ මංගල ධර්මදේශනාව කුමක්ද? එය දේශනා කළේ කාටද?
   ii. සතර පෙර නිමිතිවලින් දෙකක් ලියන්න.
   iii. තිලක්ෂණය නම් කරන්න.
   iv. කෘත්‍යය හෙවත් කාර්යය අනුව කර්මය සතර ආකාර වේ. ඉන් දෙකක් ලියන්න.
   v. අකුසල මූල තුනෙන් දෙකක් ලියන්න.
   vi. සිවබඹ විහරණවලින් දෙකක් ලියන්න.
   vii. පද්මාකාර ජීවිතය හඳුන්වන වෙනත් නමක් ලියන්න.
   viii. මිතුරන් දෙයාකාර වේ. නම් කරන්න.
   ix. සීලය සම්පූර්ණ වීමට තිබිය යුතු අංග දෙකකි. ඒවා නම් කරන්න.
   x. සතරමහා භූතවලින් දෙකක් නම් කරන්න. (ලකුණු 2 X 10 = 20යි)

2.
   i. සිඟාලෝවාද සූත්‍රයේදී ගුරුවරුන් දක්ෂිණ දිශාවට සමාන කොට දක්වා ඇත්තේ කුමන කරුණක් නිසාද? (ලකුණු 02)
   ii. ශිෂ්‍යයෙකු විසින් ගුරුවරයාට පස් ආකාරයකින් සැලකිය යුතුබව බුදුන්වහන්සේ වදාළහ. ඉන් තුනක් ලියන්න. (ලකුණු 03)
   iii. ගුරු-ශිෂ්‍යය අන්‍යෝන්‍ය යුතුකම් ඉටු කිරීමෙන් පරමාදර්ශී යහපත් සමාජයක් බිහිවීමට මඟ පෑදෙයි. ඔබේ අදහස් ඉදිරිපත් කරන්න. (ලකුණු 05)

3.
   i. පද්මාකාර ජීවිතය යනු කුමක්ද? (ලකුණු 02)
   ii. පද්ම උපමාව අනුව බුදුරදුන් වදාළ ත්‍රිවිධ පුද්ගලයින් නම් කරන්න. (ලකුණු 03)
   iii. පද්මාකාර ජීවිත බුදු සිරිතෙන් උදාහරණ දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

4.
   i. සහජීවනය යනු කුමක්ද? (ලකුණු 02)
   ii. බුදුන්වහන්සේ අන්‍ය මතවාද ඉවසීම හා ගරු කිරීම අවවාදයෙන් මෙන්ම ආදර්ශයෙන්ද පෙන්වා වදාළහ. මේ කියමන සනාථ කිරීමට උදාහරණ 03ක් ලියන්න. (ලකුණු 03)
   iii. බහු ආගමික සමාජක සහජීවනයෙන් කටයුතු කිරීම සඳහා බෞද්ධ ඉගැන්වීම ඉවහල්වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)



Scanned with CamScanner

5.

i. උපතිස්ස පිරිවැජිතුමා අස්සජි මහරහතන් වහන්සේගෙන් විමසූ පැනය කුමක්ද? (ලකුණු 02)

ii. යේ ධම්මා හේතුප්පභවා ....... ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 03)

iii. "හේතුව හා ඵලය" යන්න හේතු ඵල දහම අනුව පැහැදිලි කරන්න. (ලකුණු 05)

6.

i. පරිසර දෙයාකාර වේ. නම් කරන්න. (ලකුණු 02)

ii. බුදුන්වහන්සේ ස්වාභාවික පරිසර ආශ්‍රිතව වස් විසූ ස්ථාන තුනක උදාහරණ ලියන්න. (ලකුණු 03)

iii. පරිසරයේ සොඳුරු බව ඇඟවීමට ලක් කළ අවස්ථා 05 කට උදාහරණ ලියන්න. (ලකුණු 05)

7. පහත සඳහන් මාතෘකා අතරින් දෙක්ක පමණක් කෙටි සහන් ලියන්න.

i. ත්‍රිලක්ෂණ

ii. ආර්ය අෂ්ටාංගික මාර්ග

iii. වැලිවිට සරණංකර සංඝරාජ හිමි

iv. බෞද්ධයාගේ අත්පොත (ලකුණු 10)

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Scanned with CamScanner